ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண ரபை கட்டிடத் தொகுதி, 4ம்மாடத "ஆ" ஹரிச்சந்திரா மாவத்த. அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரனை / Inquries: 025-2235790
Fax : 025-2224914
E-mail csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/17/3-1

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2026.01. 20

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක **2022/02(IV)**

උතුරු මැද පළාත්
සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු දීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (V) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, 2022.06.22 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු දීම 2026.01.01 දිනෙන් පසු අවලංගු කර ඇති බැවින්, එකී චක්‍රලේඛ විධිවිධාන අනුව දේශීය/විදේශීය නිවාඩු ලබා ගැනීමට නව නිවාඩු අයදුම්පත්‍ර හෝ නිවාඩු දීර්ඝ කිරීමේ අයදුම්පත් අනුමැතිය සඳහා මා වෙත යොමු නොකරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03. යථෝක්ත චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු ලබාගෙන ඇති නිලධාරීන් සමහරක් මේ වන විට නැවත සේවයට වාර්තාකර ඇති අතර අනෙක් නිලධාරීන් ඉදිරියේදී පූර්ව සේවා ස්ථානවලට නැවත සේවයට වාර්තා කිරීමට නියමිතව ඇත. එබැවින් මෙම නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(IV) හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කල යුතුය.

04. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(IV) හි 2:7 හා 2:15 උප වගන්ති කෙරෙහි සියලුම ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු කරන අතර එකී උපවගන්තිවල සඳහන් විධිවිධාන පරිදි වැටුප් රහිත නිවාඩු අවසන්කර නැවත සේවයට වාර්තා කරන නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කල යුතු අතර ඒ පිළිබඳ තහවුරුවක් සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුලත් කල යුතුය.

05. ඉහත චක්‍රලේඛන විධිවිධාන ප්‍රකාරව වැටුප් රහිත දේශීය හෝ විදේශීය නිවාඩු ලබාගෙන ඇති විධායක ශ්‍රේණිවලට අයත් නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හි සඳහන් විධිවිධාන පරිදි නිදහස් වාහන ආනයන බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී , ඒ සඳහා වන සක්‍රිය සේවා කාලය ගණනය කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(IV) හි 2:7 උප වගන්තියෙහි සඳහාන් විධිවිධාන පරිදි කටයුතු කල යුතුය.

06. දැනට අනුමත වැටුප් රහිත දේශීය/විදේශීය නිවාඩු කාල සීමාව අවසන් වූ වහාම අදාල නිලධාරීන් තම නිත්‍ය සේවා ස්ථාන වලට වාර්තා කල යුතු අතර, එසේ වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති XV වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. එසේම අනුමත නිවාඩු කාල සීමාව අවසන් වීමට ප්‍රථම නැවත සේවයට වාර්තා කරන නිලධාරීන් සම්බන්ධයෙන් මගේ සමාංක හා 2024.12.20 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 2022/02(II) හි 5.III හා 5.IV උප වගන්තිවල සඳහන් උපදෙස් පරිදි කටයුතු කල යුතුය.

07. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022(IV) හා මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන තරයේ පිළිපැදිය යුතු බවත් සියලුම ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් තම පෞද්ගලික අවධානය යොමුකර කටයුතු කල යුතු බවද අවධාරණය කරමි.

ජේ.එම්.ආර්.පී.ජයසිංහ
ප්‍රධාන ලේකම්
උතුරු මැද පළාත.

පිටපත - ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාර කාර්යාලය, උ.මැ.ප - ගරු ආණ්ඩුකාරතුමන් දැනුවත් කිරීම සඳහා


| | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පුහුණු / பயிற்சி / Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planing | ඉංජිනේරු / பொறியியல் / Engineering | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|---|---|
| දුරකථනය / தொ.பே.இல / Telephone | | 025-2224915 | 025-2228252 | 025-2237430 | 025-2222238 | 025-2220910 | 025-2222736 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | | 025-2222736 | 025-2220950 | 025-2237430 | 025-2225295 | 025-2235787 | 025-2222736 |
| විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail | | ocsncpc@gmail.com | ncpmdtu@gmail.com | treasuryncp@gmail.com | dept.planning.ncp@gmail.com | ncpengineering@yahoo.com | ocsncpc@gmail.com |